# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1948/8 - 2016 ජනවාරි මස 05 වැනි අඟහරුවාදා - 2016.01.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය :* IR/22/42/2009

**කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය**

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2010.12.02 දිනැති හා අංක 1682/38 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2010.11.19 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් රත්තොට, මාඋස්සාගොල්ල, අංක 67/2හි පදිංචි ඩබ්. එම්. චන්ද්‍රරත්න මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2015.08.05 වැනි දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2015 දෙසැම්බර් මස 28 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

### කම්කරු ආරාවුල් බේරුම්කරණය

ඩබ්. එම්. චන්ද්‍රරත්න,
අංක 67/2,
මාවුස්සාගොල්ල,
රත්තොට.

-ඉල්ලුම්කරු-

නඩු අංකය : A/3365 හා

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

-වගඋත්තරකරු-

### ප්‍රදානය

කම්කරු සබඳතා සහ ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් 1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවිය යුතු 1957 අංක 14, 1962 අංක 04 හා 1968 අංක 39 දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 සංශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත් කර පහත සඳහන් ආරවුල බේරුම්කරණයක් මගින් සමථකරන ලෙසට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ :-

''මාතලේ ඩිපෝවට අනුයුක්තව ඩිපෝ පරීක්ෂකයෙකු වශයෙන් සේවය කරමින් සිටියදී වෛද්‍ය හේතූන් මත 2006.11.06 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවයෙන් විශ්‍රාම ගන්වනු ලැබූ ඩබ්. එම්. චන්ද්‍රරත්න මහතාට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අංක 1974/04 දරන සේවක මණ්ඩල චක්‍රලේඛයේ අංක (අ) (11) වගන්තිය ප්‍රකාරව ඔහුගේ සේවා කාලය වෙනුවෙන් වන්දි මුදලක් ලබා ගැනීමට හිමිකම් ලබන්නේ ද යන්න හා හිමිකම් ලැබෙන්නේ නම්, ඔහුට හිමි වන්දි මුදල් ප්‍රමාණය කුමක්ද යන්න පිළිබඳව වේ.''



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*බේරුම්කරණ විභාගය*

මුල් යොමු කිරීමේ දිනය 2010.11.19 දතම යොදා ඇතත් සත්‍ය වශයෙන් අදාළ ලිපිය මා අතට පත් වූයේ 2013.06.15 දින වන අතරවීම නිසා විමසීම් 2013.07.03 දින ආරම්භ කරන ලදී.

01. දෙපාර්ශ්වයටම සාධාරණව සවන් දීමේ අවශ්‍යතාවය මත දින 14ක් විමසීම සඳහා රැස්වන ලදී.

02. ඉල්ලුම්කරු විසින් ප්‍රකාශයක් ඉදිරිපත් නොකරන ලද අතර ඉල්ලුම්කරු අංශභාග රෝගී තත්වයට පත්ව සිටින බැවින් වාචික සාක්ෂිදීමේ නොහැකියාව මත 2013.11.25 වැනි දින දරන ''X1'' සිට ''X10'' දක්වා ඇමුණුම් සහිත දිවුරුම් ප්‍රකාශය ලිඛිත සාක්ෂි ලෙස වූ මා විසින් පිළිගන්නා ලදී.

03. (i) වගඋත්තරකරුගේ 2010.01.05 දින දරන පළමු ප්‍රකාශය විමසීම් සඳහා ප්‍රකාශයක් ලෙස සලකා බලන ලදී.

(ii) ඊට අමතරව වගඋත්තරකරු වෙනුවෙන් සාක්ෂිදීම සඳහා වගඋත්තරකරු ඔහුගේ සහකාර මානව කළමණාකරු කැඳවා තිබිණි.

04. (i) විමසීම් අවසානයේ පාර්ශ්වයන් විසින් වාචික සැළකිරීම් නොකරන ලදී.

(ii) ඉල්ලුම්කරු හා වගඋත්තරකරු වෙනුවෙන් ලිඛිත දේශන ගොනු කර ඇත.

මූලික වශයෙන් පහත සඳහන් පිළිගැනීම් වාර්තාගත කරන ලදී.

(01) ඉල්ලුම්කරු ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට අනුයුක්තව බැඳී 2006.11.06 වැනි දින දක්වා සේවය කළ බව පිළිගනී.

(02) එම මහතා 2006.11.06 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවයෙන් විශ්‍රාම ගැන් වූ බව පිළිගනී.

(03) එකී විශ්‍රාම ගැන් වූ දින වන විට ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ අංක 1974 අංක 4 දරන සේවක මණ්ඩල චක්‍රලේඛය ක්‍රියාත්මක වෙමින් පැවැති බව පිළිගනී.

(04) ඊට අමතරව ඒ වන විට සේවක මණ්ඩල කොට්ඨාශ 1975 අංක 10 දරන චක්‍රලේඛයද ක්‍රියාත්මක වූ බව පිළිගනී.

(05) ඉල්ලුම්කරු 1987.01.29 දින මාතලේ බස් ඩිපෝවට අනුයුක්තව තාවකාලික බස් කොන්දෙස්තරවරයෙක් ලෙස සේවය ආරම්භ කරන ලද බව පිළිගනී.

(06) වර්ෂ 2002 හෝ ආසන්නයේදී ඉල්ලුම්කරු viii ඒ ශ්‍රේණියට උසස්වීමක් ලබා ගත් බව පිළිගනී.

(07) වෛද්‍යමය හේතු මත ඩිපෝ පරීක්ෂකවරයෙකු වශයෙන් සේවය කිරීමට ඉල්ලුම්කරුට වූ නොහැකියාව මත ඉල්ලුම්කරුව විශ්‍රාම ගන්වන ලද බව.

(08) ඉල්ලුම්කරුගේ දිවුරුම් ප්‍රකාශය සමග ඉල්ලුම්කරු විසින් “X1” සිට “X10” ලෙස සලකුණු කරන ලද ලේඛන ඉදිරිපත් කර ඇත. වගඋත්තරකරු එකී ලේඛන පිළිගෙන ඇත.

(i) ඉල්ලුම්කරු විසින් දිවුරුම් ප්‍රකාශ සාක්ෂි ලබාදීමෙන් අනතුරුව වගඋත්තරකරුගේ සාක්ෂි කැඳවීම් දින සාක්ෂිකරුවන් සඳහා සිතාසි නිකුත් කිරීමට හා සාක්ෂිකරුවන්ගේ නොපැමිණීම සඳහා වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම මත ප්‍රදනය කිරීමට ලිඛිත දේශන ඉදිරිපත් කිරීම සඳහා දිනයක් ලබාදෙන ලදී.

(ii) වගඋත්තරකරුගේ පැහැදිලි කිරීම් හා ඉල්ලුම්කරුගේ එකගත්වය මත කරුණු විමසීම් වැඩිදුරට ඉදිරියට පවත්වාගෙන යන්නට තීරණය කරන ලදී.

*ඉල්ලුම්කරුගේ ස්ථාවරය*

01. ඉල්ලුම්කරු 1987.01.29 දින තාවකාලික බස් රථ කොන්දෙස්තරවරයෙකු වශයෙන් රැකියාව ආරම්භ කර පසුව සේවයේ ස්ථිර කරන ලද බව.

02. ඉල්ලුම්කරු ඔහුගේ වෘත්තීමය ජීවිතයේ උසස්වීම් ලබාගනිමින් VIII A ශ්‍රේණියේ ඩිපෝ පරීක්ෂක තනතුරේ සේවය කරමින් සිටියදී 2006.11.06 වන දින වෛද්‍යමය හේතු මත විශ්‍රාම ගන්වන ලද බව.

03. ඉල්ලුම්කරු විශ්‍රාම ගන්වන අවස්ථාවේ ඔහුගේ මාසික වැටුප රු. 12,705.00ක් බව.

04. විශ්‍රාම ගන්වන අවස්ථාවේදී ඉල්ලුම්කරුගේ වයස අවුරුදු 54, මාස 05, දින 13ක් බව හා ඒ වන විට ඉල්ලුම්කරු, වගඋත්තරකරු වෙනුවෙන් වර්ෂ 19කුත්, මාස 09ක කාලයක සේවය ලබා දී ඇති බව.

05. ඉල්ලුම්කරුගේ විශ්‍රාම ගැන්වීමට අදළ වනුයේ සේවක මණ්ඩල චක්‍රලේඛ 1974 අංක 04 සහ 1975 අංක 10(R1 සහ R2) යන චක්‍රලේඛ පමණක් බව.

06. එම නිසා ඉල්ලුම්කරුගේ ස්ථාවරය වූයේ ඔහුට 1974 අංක 04 සේවක මණ්ඩල චක්‍රලේඛයේ අ(II) වගන්තියේ ප්‍රතිපාදනයන් යටතේ වන්දි ලැබීමට හිමිකම් ඇති බැව්.

*චක්‍රලේඛවල විධිවිධාන*

වගඋත්තරකරුගේ ස්ථාවරය පරීක්ෂා කිරීමට ප්‍රථම මා විසින් අදාල චක්‍රලේඛ දෙකෙහි (R1 සහ R2) ප්‍රතිපාදනයන් නිරීක්ෂණය කරමි.

01. වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගන්වන පුද්ගලයන්ට වන්දි ලබාදීමට ප්‍රතිපාදන චක්‍රලේඛ 1974 අංක 04 (R1) හි දැක්වේ. එය ප්‍රධාන කොටස් දෙකකට වෙන් කල හැකිය.

(i) වයස අවුරුදු 55 සපුරාලීමෙන් විශ්‍රාම ගන්වන පුද්ගලයන්

(ii) වයස අවුරුදු 55ට වැඩි වයසකට එළඹීමෙන් පසු විශ්‍රාම ගන්වන පුද්ගලයන්

ඉහත කී චක්‍රලේඛ (R1) මගින් වයස අවුරුදු 59ට වඩා වැඩි පුද්ගලයන් සඳහා වන්දි ලබා දීමට ප්‍රතිපාදන සලසා නොතිබූ හෙයින් එබඳු පුද්ගලයන්ට වන්දි ලබාදීමට ප්‍රතිපාදන චක්‍රලේඛ 1975 අංක 10(R2) මගින් සලසන ලදී.

එම නිසා R1 හා R2 චක්‍රලේඛ දෙක එක්ව කියවිය යුතුවේ.

*වගඋත්තරකරුගේ ස්ථාවරය*

01. ඉල්ලුම්කරුට අදල ඉහත දත්තයන් වගඋත්තරකරු විසින් පිළිගන්නා ලදී.

02. R1 හා R2 යන චක්‍රලේඛ දෙක ඉල්ලුම්කරුට අදාලව ක්‍රියාත්මක වන බව වගඋත්තරකරු විසින් පිළිගන්නා ලදී. (04 වන ඡේදය)

03 (i) වගඋත්තරකරුගේ ස්ථාවරය චක්‍රලේඛ 1975 අංක 10හි 02 වන වගන්තියට අනුව විශ්‍රාම ගන්වන අයෙකුට මාසික දනුම් දීමක් වෙනුවට වන්දි ලැබීමට හිමිකමක් නොමැති බවත් ඒ නිසා ඉල්ලුම්කරුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළ යුතු බවත් වගඋත්තරකරුගේ ප්‍රකාශයේ (05 ඡේදය) ස්ථාවරය විය.

(ii) එහෙත් අවධානයට ලක්විය යුත්තේ එකී චක්‍රලේඛය අදල වනුයේ වයස 59 ඉක්මවා විශ්‍රාම යන අයට පමණක් අදල වන බවත් වයස 54 දී විශ්‍රාම ගන්වනු ලැබූ ඉල්ලුම්කරුට අදල නොවන බවත්ය.

04 (i) නමුත්, වාචික සාක්ෂි විමසීමේදී කියා සිටියේ රජයේ විශ්‍රාම යන වයස අවුරුදු 55 තෙක් අඩු කිරීමේ රජයේ ප්‍රතිපත්තිය නිසා වයස අවුරුදු 55න් විශ්‍රාම ගැන්වීමේදීත් චක්‍රලේඛ R1 හා R2 අදල කර ගන්නා ලද බවයි.

(ii) රජය විසින් විශ්‍රාම ගැනීමේ වයස් සීමාව අවුරුදු 55 දක්වා අඩු කිරීමේ රජයේ චක්‍රලේඛ නිසා අංක 75 දරන රජයේ චක්‍රලේඛයේ (R4) හේතු කොට ගෙන වගඋත්තරකරු විසින් සේවක මණ්ඩල චක්‍රලේඛ 1976 අංක 5 දරන චක්‍රලේඛය (R3) නිකුත් කරන ලද බැව් වගඋත්තරකරු වෙනුවෙන් වාචික සාක්ෂි මෙන්ම ලිඛිත සැළ කිරීම් මගින් දන්වා සිටින ලදී.

05. විශ්‍රාම ගන්වන උපරිම වයස් සීමාව අවුරුදු 55 දක්වා R4 හා R3 චක්‍රලේඛ මගින් අඩු කරන ලද නමුත් R1 හා R2 සේවක මණ්ඩල චක්‍රලේඛවල සංශෝධනයන් නොකරන ලද බවටත්, මෙම කාරණය සඳහා 1998.11.17 දින දරන සීමාසහිත ඌව බස් සමාගමේ කාර්ය භාර නිලධාරී වෙත ආමන්ත්‍රිත ලිපිය (R5) උපයෝගී කර ගන්නා ලද බව වගඋත්තරකරු විසින් කියා සිටින ලදී.

06. (i) ඉල්ලුම්කරු වෙනුවෙන් පෙන්වා දුන් පරිදි ලිපිය (R5) වනාහි කේ. ඇම්. සේනානායක නැමැති කාර්යාල කාර්ය සහායකගේ තත්වය පැහැදිලි කරමින් සේවක මණ්ඩල කළමනාකරු විසින් 1998.11.17 දතමින් ඌව බස් සමාගමේ කාර්ය භාර නිලධාරී වෙත යවන ලද ලිපියක් වන අතර බැලු බැල්මට එය සියළුම සේවකයින්ට අදල වන චක්‍රලේඛයක් බවට අනාවරණය නොවේ.

(ii) එය ලිපියකට පිළිතුරු ලිපියක් වන අතර එය වගඋත්තරකරුගේ කළමණාකාර තීරණයක් බව එහි නොදක්වේ.

(iii) එමෙන්ම එහි කියා ඇත්තේ ඒ අනුව ''ක්‍රියාකිරීම මැනවි'' ලෙස වන අතර එය විධානාත්මක නියෝගයක් නොවේ.

07. විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස් සීමාව වෙනස් වීම සමග සිදුවිය යුතු වෙනස් වීම දක්වෙන R5 ලිපිය වගඋත්තරකරුගේ සාක්ෂිවලින් පිළිගත් පරිදි නිසි කළමනාකාරිත්වය තීරණයකින් නිගමනයකින් තොරව නිලධාරියෙකුගේ මතයක් හේතුකොට ගෙන කරන ලද ක්‍රියාවන් වන අතර ඒ මගින් ඉල්ලුම්කරුට බැඳියාවක් නැත.

*සම්පිණ්ඩනය*

ඉහත කරුණු අනුව මතු කරන ලද විසඳනාවන්ට පහත සඳහන් පරිදි පිළිතුරු සපයමි.

ඉල්ලුම්කරු වෙනුවෙන් මතු කරන ලද විසඳනා

01 ප්‍ර.- ඉහත කී 1974/4 දරන සේවක මණ්ඩල චක්‍රලේඛයේ ප්‍රතිපාදන අනුව වෛද්‍ය හේතු මත විශ්‍රාම ගැන්වීමේ දී වයස 55ට අඩු සේවකයන් සඳහා අවුරුදු 05කට

වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් මාස 05ක වැටුප සමඟ මාස 12ක වැටුප උපරිමයට යටත් අවුරුදු 05කට වැඩි එක් එක් අවුරුද්ද වෙනුවෙන් අතිරේක වශයෙන් එක් මසක වැටුප බැගින් වන්දි මුදලක් ලැබීමට අයිතියක් ඇද්ද ?

උ.- ඔව්

2. ප්‍ර.- ඉහත කී විසඳනාවට ඉල්ලුම්කරුගේ වාසියට පිළිතුරු ලැබෙන්නේ නම් එම අයිතිය වෙනුවෙන් ඉල්ලුම්කරුට ලැබිය යුතු සහන ඉල්ලුම්කරුට ලැබීමට අයිතියක් ඇද්ද ?

උ.- ඔව්

03 ප්‍ර.- ඉහත කී විසඳනාවට ඉල්ලුම්කරුගේ වාසියට පිළිතුරු ලැබෙන්නේ නම් ඉල්ලුම්කරුට ලැබිය යුතු සහන මොනවාද ?

උ.- ඒ අනුව ඉල්ලුම්කරුට වන්දි වශයෙන් මාස 05ක වැටුපක් හා ඔහු අවුරුදු 19කට වඩා සේවය කර ඇති හෙයින් මාස 12ක වැටුපක් එනම් රුපියල් 215,985ක් (රු. 12,705x5+12,705x12) මුදලක් මම ප්‍රදනය කරමි.

*වගඋත්තරකරුගේ විසඳනා*

04. ප්‍ර- මෙම නඩුවේ ඉල්ලුම්කරුට 1975 අංක 10 දරන සේවක මණ්ඩල කොට්ඨාශ චක්‍රලේඛයකට අදල වේද ?

උ.- ඔව්, පිළිගැනීම් මත සේවක මණ්ඩල චක්‍රලේඛ 1974 අංක 4 ද, 1975 අංක 10 චක්‍රලේඛයද අදල වේ.

05. ප්‍ර - එසේ අදල වන්නේ නම් නඩුවේ ඉල්ලුම්කරු අයැද සිටින ආකාරයට වන්දි මුදලකට හිමිකම් කිව හැකි ද ?

උ - ඉහත කී 04 වන විසඳනාවට පිළිතුරු ඉල්ලුම්කරුගේ වාසියට ලැබීම නිසා ඉල්ලුම්කරුට වන්දි ලැබීමට අයිතියක් ඇත්තේ ය.

*නිගමනය*

01. මේ අනුව වගඋත්තරකරුගේ පිළිගැනීම් මතම ඉල්ලුම්කරුට අදලව ක්‍රියාත්මක විය යුතු චක්‍රලේඛ වනුයේ 1974 අංක 04(R1) සමග කියවිය යුතු 1975 අංක 05 (R2) දරන චක්‍රලේඛ බැව් අනාවරණය වේ.

02. විශ්‍රාම ගැන්වීම සඳහා උපරිම වයස් සීමාව චක්‍රලේඛ R4 හා R3 අනුව වෙනස් කරන ලද්දේ වුවද වයස අවුරුදු පනස් පහකට එළඹීමට පෙර වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්වනු ලබන පුද්ගලයන්ට ගෙවනු ලබන වන්දි පිළිබඳව සේවකයන් දැනුවත් කරනු ලබන චක්‍රලේඛයක් වගඋත්තරකරු විසින් නිකුත් කර නැත.

03.1974 අංක 04(R1) සමඟ කියවිය යුතු 1975 අංක 05 දරන මණ්ඩලය චක්‍රලේඛවල ප්‍රතිපාදන වෙනස් කිරීමට චක්‍රලේඛයක් නිකුත් කල බව හා/හෝ වලංගු කළමණාකාරිත්වය තීරණයකට එළඹුන බැව් සනාථ කිරීමට වගඋත්තරකරු අසමත්වීම මත හා අදල චක්‍රලේඛ වනුයේ R1 හා R2 බවට වූ වගඋත්තරකරුගේ පිළිගැනීම මත ඉල්ලුම්කරුට වන්දි වගඋත්තරකරු විසින් 1974 අංක 4 දරන චක්‍රලේඛයේ (R1) අ(II) වගන්තියේ ප්‍රතිපාදන මත ගෙවිය යුතු බැව් මගේ නිගමනය වේ.

04. ඒ අනුව ඉල්ලුම්කරුට වන්දි වශයෙන් මාස 05ක වැටුපක් හා ඔහු අවුරුදු 19කට වඩා වැඩි කාලයක් සේවය කර ඇති හෙයින් තවත් මාස 12ක වැටුපක් එනම් රුපියල් 215,985ක් (රු. 12,705x5+12,705x12) මුදලක් ලැබිය යුතු බවට මම ප්‍රදනයක් කරමි.

05.විශ්‍රාමික දිනය වන 2006.11.06 දින සිට 2015.04.30 දින තෙක් කාල වකවානුව සහ ඉල්ලුම්කරුගේ අංශභාග තත්වය සලකා බලමින් වගඋත්තරකරු විසින් ඉල්ලුම්කරු විශ්‍රාම ගිය දින සිට වන්දිය සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය තෙක් ඊට නෛතික පොලියද වගඋත්තරකරු විසින් ඉල්ලුම්කරුට ගෙවිය යුතු වේ.

ප්‍රදනය

ඉහත කී කරුණු හා තුලනාත්මක සම්භාවිතාව අනුව බේරුම් කිරීම මගින් නිරවුල් කිරීම සඳහා මා වෙත යොමු කරන ලද කාරණයන්ට අදළව පහත සඳහන් ප්‍රදනය මා විසින් කරනු ලැබේ.

එම නිසා මා විසින් රු. 215,985.00/- (රු. 12,705x17) වන්දියක් ද විශ්‍රාම ගත් දිනයේ සිට එනම් 2006.11.06 වැනි දින සිට එම මුදල ප්‍රදනය කරන දින මුදල සම්පූර්ණ වශයෙන් ගෙවා නිම කරන තෙක් නෛතික පොළිය ද ගෙවිය යුතු බවට ප්‍රදනය කරමි.

ඒ අනුව ඉහත ප්‍රදනය සාධාරණ හා යුක්තියුක්ත ප්‍රදනයක් බව සලකමි.

නීතිඥ ආචාර්ය මහින්ද රූපනාව,
බේරුම්කරු.

2015 අගෝස්තු මස 05 වැනි දින.

01-701

මගේ අංකය : IR/22/29/2011

**කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය**

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2014.02.11 දිනැති හා අංක 1849/13 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2014.01.31 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් වේරගංතොට, 39 ඇළ, අංක 372හි පදිංචි ඒ. ඩබ්. චන්ද්‍රසේකර බංඩා මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2015.10.23 වැනි දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2015 දෙසැම්බර් මස 28 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

යොමු අංකය : IR/22/29/2011.

කාර්මික අධිකරණයේ දී ය

ඒ. ඩබ්. චන්ද්‍රසේකර බංඩා මයා,
අංක 372, 39 ඇළ,
වේරගංතොට.

-ඉල්ලුම්කරු-

නඩු අංකය : A/3537 හා

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

-වගඋත්තරකරු-

**යන දෙපාර්ශ්වය අතර පැවති කාර්මික ආරවුල සම්බන්ධ ප්‍රදානයයි**

කම්කරු හා කම්කරු සබඳතා ගරු අමාත්‍ය ගාමිණී ලොකුගේ මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව උක්ත ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2014.01.31 වැනි දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

02. ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ :-

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ උඩුදුම්බර ඩිපෝවේ කොන්දොස්තර මහතෙකු ලෙස සේවයේ නියුතු ඒ. ඩබ්. චන්ද්‍රසේකර බණ්ඩා මහතා ඇතුළු සේවක පිරිසකට 2004.04.08 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි උසස්වීම් ලබා දී එය 2004.04.18 වැනි දින අවලංගු කර නැවත 2005.05.01 වැනි දින සිට එම උසස්වීම් ලබා දීමේදී ඒ. ඩබ්. චන්ද්‍රසේකර බණ්ඩා මහතාට පමණක් පෙර ලබා දුන් මහනුවර බස් සමාගමේ ජ්‍යෙෂ්ඨ ඩිපෝ පරීක්ෂක තනතුරට උසස්වීම් ලබා නොදීමෙන් ඔහුට යම් අසාධාරණයක් සිදු වී ඇත් ද ? එසේ සිදු වී ඇත්නම් හිමිවිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳ වේ.

03. කම්කරු කොමසාරිස්ගේ යොමුවේ සඳහන් ආරවුලට අදළව පාර්ශවයන්ගෙන් ප්‍රකාශ සහ ප්‍රතිප්‍රකාශ ලබා ගැනීමෙන් පසු සිද්ධියට අදළව වැඩි විස්තර වගඋත්තරකාර පාර්ශවය සතුව ඇති බැවින් සහ අදළ චක්‍ර ලේඛන ආදිය එම පාර්ශවය සතුව ඇති බැවින් නඩුවේ ප්‍රථමයෙන් සාක්ෂි මෙහෙයවීම මා විසින් වගඋත්තරකාර පාර්ශවයට පවරා විභාගය 2014.08.21 වැනි දින ආරම්භ කරන ලදී. එදින පැමිණිලි පාර්ශ්වය වෙනුවෙන් නියෝජිත ශ්‍රේෂන් ද සිල්වා පෙනී සිටි අතර, වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ ආර්. ගුණරත්න මහතා පෙනී සිටියේය. ඉන් පසු මෙම නියෝජිත සහ නීතිඥ ආර්. ගුණරත්න යන මහත්වරුන් පාර්ශවයන් වෙනුවෙන් බේරුම්කරණය ඉදිරියේ පෙනී සිටියහ.

04. වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් ලංකා ගමනාගමන මණ්ඩලයේ කම්කරු සබඳතා සේවක මණ්ඩල කොට්ඨාස විභාග නිලධාරී පට්ටියෙ ආරච්චිලාගේ ධම්මික කපිල මන්ත්‍රී සාක්ෂි දීම ආරම්භ කරන ලදී.

මේ සාක්ෂිකරුගේ සාක්ෂිය අනුව ''යම් සේවකයෙක් ආයතනයේ කම්කරු සබඳතා හා සම්බන්ධ සේව්‍ය පාර්ශවයට ඇතිවන ගැටලුවලදී සේවකයා හා තුලනාත්මකව ගැටලු විසඳා ගැනීම'' වේ.

05. වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් සාක්ෂි දී ඇත්තේ විභාග නිලධාරී පට්ටියෙ ආරච්චිලාගේ ධම්මික කපිල මන්ත්‍රි මහතා පමණි. එහෙත් වගඋත්තරකාර පාර්ශවය සතු ලිපි ලේඛන විනය රෙගුලාසි චක්‍ර ලේඛන ආදිය කිසිවක් ඉදිරිපත් කරමින් තම නඩුව ඉදිරියට ගෙන යාමට වගඋත්තරකාර පාර්ශවයේ උගත් නීතිඥවරයා ප්‍රයත්නයක් දරා නැති අතර, හැකි තරම් ඉක්මණින් නඩුව අවසන් කිරීමට ඔහුගේ ප්‍රයත්නය අගේ කළ යුතු ය.

06. වගඋත්තරකාර පාර්ශවයේ එකම සාක්ෂිකරු වන පට්ටියෙ ආරච්චිලාගේ ධම්මික කපිල මන්ත්‍රී මහතාගේ සාක්ෂිය අනුව ඉල්ලුම්කරු R/01 අනුව සේවයෙන් පහ කර ඇත. එහෙත් ඉල්ලුම්කරුට තම නිදහසට කරුණු දක්වීමට අවස්ථාවක් ලැබී නැත. චෝදනා පත්‍රයේ සඳහන් සියළුම චෝදනාවලට ඉල්ලුම්කරු වැරදිකරු වූ බව R/01හි සඳහන් වෙතත් චෝදනා පත්‍රයෙහි සඳහන් චෝදනාව මොනවාද යන්න සඳහන් නොවේ.

07. මහනුවර අංක 03 දරන විනිශ්චය සභාවේදී නඩුව සමථයකට පත්ව ඇති අතර ගන්නා ලද සමථය අනුව ඉල්ලුම්කරුට උසස්වීම ලබා දීමට වගඋත්තරකාර පාර්ශවය ප්‍රයත්නයක් දරා නැත. මේ නිසා ඉල්ලුම්කරු අසහනකාරී තත්ත්වයකට වැටී ඇත.

ඉල්ලුම්කරු ඔහුගේ නියෝජිත ග්‍රේෂන් ද සිල්වා මහතා මගින් බොහෝ කරුණු ඇතුළත් ලිඛිත දේශනයක් X/01 වශයෙන් සලකුණු කර ඉදිරිපත් කර ඇත. එමෙන්ම ඉල්ලුම්කරුද සවිස්තර පැහැදිලි සාක්ෂියක් ඉදිරිපත් කොට ඇත.

(i) 2004 මැතිවරණයෙන් පසු 2004.04.08 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලුම්කරු මහනුවර බස් සමාගමේ ජ්‍යෂ්ඨ ඩිපෝ පරීක්ෂක තනතුරෙහි පිහිටුවා ඇත. තනතුරට අදළ පඩි ක්‍රමය මෙසේ ය.

රු. 3465/-40x10+55x7 = රු. 4250/- ඒ අනුව මසකට සියළුම දීමනා ඇතුලුව රු. 3465/-කි. ඔහුට දෙන ලද නව පඩි අංකය 64 වේ.

(ii) එහෙත් පත්වීම් ලිපියෙන් දීලා නැවත කොන්දෙස්තර කෙනෙකු වශයෙන් ඉල්ලුම්කරු තාවකාලික සේවයට ගෙන ඇත.

(iii) එහෙත් A/01 අවලංගු කර ඇත. A/02 අනුව උසස්වීම් අවලංගු කිරීමෙන් පසු නැවත පත්වීම් ප්‍රදනය කිරීමේදී නම් 16ක් සඳහන් වන මුත්, ඉල්ලුම්කරුගේ නම එහි සඳහන් නොවේ.

(iv) ඉන් පසු ඉල්ලුම්කරු මහනුවර ඩිපෝ කළමනාකරුට A/03 ලිපිය යවන ලද අතර, ඉන් පසු කම්කරු කොමසාරිස් ජනරාල් වෙත කරුණු ඉදිරිපත් කරන ලදී.

08. කම්කරු කොමසාරිස් ජනරාල්ට මෙම ආරවුල සමථයකට පත් කිරීමට නොහැකි වූ බැවින් කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ කම්කරු ඇමතිතුමාගේ බලතල අනුව බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීමට බේරුම්කරු වශයෙන් මා පත් කරන ලදී.

09. ඉල්ලුම්කරු තම දුක්ගැනවිල්ල අවසාන වශයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ද ඉදිරිපත් කරන ලදී. කොමිෂන් සභාව විසින් ඊට HRC/499/06/11 යන අංකය ලබා දී විභාගයක් පවත්වන ලදී. මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශ රැගත් වාර්තාව A/04 වශයෙන් සලකුණු කොට ඉල්ලුම්කාර පාර්ශවයේ ලිඛිත දේශනයට අමුණා ඇත. එම නිර්දේශය පහත දැක්වේ.

''සී/ස මහනුවර බස් සමාගමේ සේවක මණ්ඩල කළමනාකාරවරයාගේ අත්සන ද සහිත අංක මබස/සේමකො/පා/01/13 හා 2004.04.07 වැනි දින දරන ලිපියේ දැක්වෙන පරිද්දෙන් මෙම පෙත්සම්කරු <u>අදළ උසස් වීමෙහි පිහිටුවන ලෙසත්,</u> විනය නියෝගය පරිදි පෙත්සම්කරුට ලබා දී ඇති දඬුවම් ඉවත් කරන ලෙසත්, එවැනි දඬුවමක් නොදුන් ලෙස සලකා පෙත්සම්කරුට අදළ හිමිකම් ලබා දෙන ලෙසත්, 01 වන වගඋත්තරකරු වෙත නියම කරන ලෙස යෝජනා කරමි.''

එහෙත් වගඋත්තරකාර පාර්ශවය මේ නිර්දේශය කෙරෙහි සැලකිල්ලක් දක්වා නැත.

10. *ඉල්ලුම්කරුට හිමි විය යුතු සහන* - ඉල්ලුම්කරුට සිදු වූ මුල්‍යමය අලාභය ඉල්ලුම්කරු විසින් ගණන් බලා එම මුදල දළ වශයෙන් X/01 ලෙස සලකුණු කොට ඉල්ලුම්කරුගේ ලිඛිත දේශනයට අමුණා ඇත.

11. 2004.04.14 වැනි දින අවලංගු කර නැවත 2005.05.01 වැනි දින සිට එම උසස්වීම් දීමේදී ඉල්ලුම්කරු ඒ. ඩබ්. චන්ද්‍රසේකර බණ්ඩා මහතාට පමණක් සමාගමේ ජ්‍යෂ්ඨ ඩිපෝ පරීක්ෂක තනතුරට උසස්වීම ලබා නොදීමෙන් ඔහුට අසාධාරණයක් සිදු වී ඇති බව සාධාරණ ලෙස ඔප්පු වී ඇත. ලිඛිත දේශනයට අමුණා ඇති X/01 ලේඛනයේ වැටුප් පරතරය අඩු කොට ඉතිරි මුදල වන රු. 1,025,559/- පමණක් ඉල්ලුම්කරුට ගෙවිය යුතු බවට මම නිගමනය කරමි.

12. X/01 ලියවිල්ලේ ජේ. ඩී. තනතුරට හිමි ගමන් වියදම් සෑදී ඇති ආකාරය පැහැදිලි ලෙස X/01හි සඳහන් නොවන බැවින් එම මුදල වන රු. 463,750/- ඉල්ලුම්කරුට ගෙවීම ගැන මා නියෝගයක් දෙන්නේ නැත. ඒ අනුව ඉල්ලුම්කරුට ගෙවිය යුතු සම්පූර්ණ මුදල වන රු. 1,025,559/-ට මම සීමා කරමි.

ඉල්ලුම්කාර ඒ. ඩබ්. චන්ද්‍රසේකර බණ්ඩාට ගෙවිය යුතු යැයි මවිසින් තීරණය කරන ලද රු. 1,025,559/- මුදල මෙම ප්‍රදනය ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කර මාස 03ක් ඇතුළත ඉල්ලුම්කරු ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ අංක 200, කිරුල පාර, කොළඹ යන ස්ථානයට කැඳවා ගෙවන ලෙස කොළඹ 05, අංක 200ට කිරුළ පාරේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට මම නියෝග කරමි. මෙම නියෝගය සාධාරණ බැව් මගේ නිගමනය වේ.

නීතිඥ ටී. පියසෝම,
බේරුම්කරු.

2015 ඔක්තෝබර් මස 23 වැනි දින.

01-702